**සිසු සාධන මට්ටම් හඳුනාගැනීමේ තක්සේරුකරණය -2022**

**මධ්‍යම පළාත**


**7 ශ්‍රේණිය** | **ගණිතය** | **කාලය - පැය 1 යි**

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න**


1. ඇපල් ගෙඩි 5ක මිල රුපියල් 625ක් නම් ඇපල් ගෙඩි 3ක මිල කීය ද?

2. ක්‍රිකට් ක්‍රීඩා කිරීමේදී එක් කණ්ඩායමකට සිටිය යුතු ක්‍රීඩකයින් ගණන, නියතයක් ද ? විචල්‍යයක් ද?

3. මෙම කුලකය නිශ්චිතව හඳුනාගත හැකි පොදු ලක්ෂණයක් මඟින් ලියා දක්වන්න.




4. කුඩා එක් කොටුවක වර්ගඵලය 1 $cm^2$ නම් මෙම රූපයේ වර්ගඵලය කොපමණ ද?


mathematica.lk

5. $x \times y \times x \times y \times x \times x$ දර්ශක ආකාරයෙන් දක්වන්න.

6. අමල්ගේ උපන් දිනය 2001.12.05 වන අතර නිමල්ගේ උපන් දිනය 2004.06.03 වේ. අමල්, නිමල්ට වඩා කොපමණ වයසින් වැඩි ද?

7. $2^3 \times 3^2$ හි අගය $5^2$ හි අගයට වඩා විශාලවේ ද කුඩාවේ ද යන්න $<$ හෝ $>$ සංකේතය යොදා ලියන්න.

8. එක්තරා පන්තියක ගැහැණු ළමයින් 14 ක් ද පිරිමි ළමුන් 35 ක් ද ඇත. ගැහැණු ළමුන් හා පිරිමි ළමුන් අතර අනුපාතය සරල ම ආකාරයෙන් ලියන්න.


9. ක්‍රි.ව. 1564 අයත් වන සියවස ලියන්න.

10. 26.... යන සංඛ්‍යාව ඉලක්කම් තුනකින් යුතු සංඛ්‍යාවකි. එම සංඛ්‍යාව 3න් ඉතිරි නැතිව බෙදීමට නම් හිස් තැනට යෙදිය හැකි ඉලක්කම් දෙකක් ලියන්න. mathematica.lk

11. ළමයෙකුගේ පොත් බෑගයක ස්කන්ධය $7\ kg\ 300\ g$ වන අතර ඉන් පොත් 5ක් ඉවත් කළ විට එහි ස්කන්ධය $2\ kg\ 250\ g$ වේ නම් බෑගයෙන් ඉවත් කළ පොත්වල ස්කන්ධය කොපමණ ද?

12. සුළු කෝණයක් ඇඳ එය ABC ලෙස නම් කරන්න.

13. $x = 3$ නම් $x + 12$ වීජීය ප්‍රකාශනයේ අගය සොයන්න.

14.  සළකුණකින් වාහන 8ක් දැක්වේ. චිත්‍ර ප්‍රස්තාරයක වාහන 20 ක් නිරූපණය කිරීමට අවශ්‍ය වන ඉහත සළකුණු ඇඳ දක්වන්න.

15. 12, 18, 60 යන සංඛ්‍යාවල මහා පොදු සාධකය සොයන්න.

16. ජපන් යෙන් 100ක වටිනාකම රුපියල් 125ක් නම් ජපන් යෙන් 15 000ක් වටිනා ඔරලෝසුවක මිල රුපියල් වලින් කොපමණ ද?

17. $3 + 2\ \times 4 - 4$ සුළු කරන්න.

18. සමමිතික අක්ෂ 3ක් පමණක් ඇති රූපයක් ඇඳ එහි සමමිතික අක්ෂ ලකුණු කරන්න.

19. $750g\ +\ 350g\ +\ 250g$ හි අගය $Kg$ හා $g$ වලින් දක්වන්න.

20. පහත දී ඇති AB සරල රේඛාවට සමාන්තර වන PQ සරල රේඛාව විහිත චතුරස්‍රය හා සරල දාරය භාවිතයෙන් අඳින්න.

A ———————— B


PARCEL NO
LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්
PADANAMA PUBLICATION
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න